# රස්නකවැව ගල් විහාර කන්ද විහාරයේ පුරාවිද්‍යාත්මක අංග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ.ඩී. අබේකුමාරි[1],ඊ.එම්.ආර්.කේ. ඒකනායක[2]

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයadabeykumari@gmail.com
[2]සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
rasikaekanayaka5@gmail.com

**ප්‍රමුඛ පදඃ** රස්නකවැව, පුරාවිද්‍යාත්මක, සෙල්ලිපි, පියගැට, ගල්ලෙන්

## හැඳින්වීම

රස්නකවැව ගල් විහාර කන්ද පුරාණ විහාරය පැරණි බෙදීම්වලට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කල්පේ කෝරලේ හුරු වැව පළාතට අයත් ගමක් ලෙස නම් කළ හැකිය. නව බෙදීම්වලට අනුව හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රස්නකවැව 118 තුලානට අයත් වේ.

මැදවච්චිය හොරොව්පොතාන මාර්ගයේ (ඊ282) හෝ කැබිතිගොල්ලෑව හොරොව්පොතාන මාර්ගයේ (29) ගමන් කිරීමෙන් රස්නකවැව ගල් විහාර කන්ද විහාරයට ප්‍රවිශ්ට විය හැකිය.

මෙම පෞරාණික විහාරය අද වන විට බොහෝ නවීකරණයට ලක් කර ඇත. එම නිසා පුරාවිද්‍යාත්මක අවශේෂවලට විශාල හානියක් සිදු වී තිබේ. එසේ ම තිබෙන අවශේෂ නව ඉදිකිරීම්වලට යට කර හෝ කඩා බිඳ තැන් තැන්වලට ඇද දමා තිබේ. නමුත් අද වන විට මෙම විහාර පරිශ්‍රයේ හඳුනාගත හැකි පුරාවිද්‍යාත්මක අවශේෂ වන්නේ, පිළිවෙළින්

- ගල් පාදම්
- වජ්‍රාසනය
- ගල් පොකුණ
- පිහිටි ගලේ සකසන ලද පියගැට පෙළ
- පියගැට පෙළෙහි ඇති සෙල්ලිපිය
- පර්වතයෙහි කපා ඇති කාණුව
- ස්තූපය
- සිරිපතුල් ගල
- කටාර කොටන ලද ලෙන්
- ලෙන් ලිපි සහිත ලෙන්

මේ අනුව රස්නකවැව ගල් විහාර කන්ද විහාරයේ පුරාවිද්‍යාත්මක සාධක පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක් සිදු කිරීම මෙම පරික්ෂණයේ මූලික අරමුණයි.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණ සිදු කිරීමේ දී මූලික වශයෙන් දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර ගවේෂණය ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රම භාවිතා කරන ලදි. ක්ෂේත්‍ර ගවේෂණයේ දී (2018.01.29) ප්‍රධාන වශයෙන් සම්මුඛ සාකච්ජා පැවැත්වීම ජයාරූප ගැනීම සිදු කරන ලද අතර ක්ෂේත්‍ර නොවන ගවේෂණයේ දී පුස්තකාල ගවේෂණය සිදු කරන ලදි.

## ප්‍රතිඵල සහ සාකච්ජාව

ක්‍රි.පූ. සිව්වැනි සියවසේ රජ කළ පණ්ඩුකාභය රජුගේ පාලන සමයේ සිට අවුරුදු දෙදහසකටත් අධික කාලයක් අගනුවර ලෙස පැවති අනුරාධපුර පුරාණ

නගරයේ සිට කිලෝමීටර 60ක් පමණ දුරින් දක්නට ලැබෙන පෞරාණික භූමියක් ලෙස රස්නකවැව ගල් විහාර කන්ද හැඳින්විය හැකිය. ක්‍රි.ව. 254 - 332 අතර කීර්ති ශ්‍රී මේඝවර්ණ රජ සමය හා ගෝඨාභය රජ සමයට මෙහි ඇති ශිලා ලේඛන අයත් වන බව සැලකේ.

විහාරය වටා වූ ප්‍රදේශය පුරා ආර්ථික වශයෙන් සමෘද්ධිමත් ජනගහනයක් එදා ජීවත් වන්නට ඇත. මෙහි භාවනා වැඩීමට අතිශයින් යෝග්‍ය පරිසරයක් වර්තමානයේ විද්‍යාමාන වේ. ළඟාවීමට අතිශයින් දුෂ්කර වූ ස්ථානවල පවා කටාර කෙටූ ඉපැරැණි ගල්ලෙන් මෙහි ඇත. ඓතිහාසික යුගයේ සිට අද දක්වාත් මෙහි පවත්නා ගල්ලෙන්වලින් පෙර දවස නේවාසික වූ භික්ෂූන්ට සිවුපසය පහසුවෙන් සැපයෙන්නට ඇති බවට පවතින පරිසරය අනුව උපකල්පනය කළ හැකි ය. මෙම විහාරයේ දක්නට ලැබෙන ශිලා ලේඛනවල සඳහන් තොරතුරුවලට අනුව අතීතයේ දී මෙය " **මාරිපාගිරිය"** ලෙස හඳුන්වා ඇත. මොරවාපි යන නම මාරීප බවට සංවර්ධනය වී මාරීපාගිරිය බවට පරිවර්තනය වී තිබේ.

උක්ත දක්වන ලද පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව අනුරාධපුර මුල් යුගයේ ඇරඹී අනුරාධපුරයේ බිඳ වැටීම දක්වා සංවර්ධනය වූ විහාරස්ථානයක් ලෙස මෙම පුරාවිද්‍යා ස්ථානය හඳුනාගත හැකිය. ඒ බවට මෙහි ඇති සෙල්ලිපි සාධක සාක්ෂි දරයි. විහාරස්ථානට ප්‍රවේශවීමේ දී මුලින් ම දක්නට ලැබෙන්නේ පාදම් ගල්ය. චතුරස්‍රාකාර හැඩයට ගැඹුරට කපා ඉවත් කරන ලද ගල් කුට්ටි පාදම් ගල් ලෙස හඳුනාගත හැකි ය. මේ මත දැව කණු සිටුවා තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

මෙම විහාරස්ථානයේ වජ්‍රාසනයක් දක්නට ලැබේ. වජ්‍රාසනය බුදුන් වහන්සේ සංකේතවත් කිරීමට යොදා ගන්නා ලද සංකේතයකි. උතුරු මැද කලාපයේ බොහෝ විහාරස්ථාන ඇසුරෙන් වජ්‍රාසනයන් දක්නට ලැබේ. රස්නකවැව ගල්ලෙන් කන්ද විහාරයට ප්‍රවිෂ්ට වීමේ දී එහි ඉදිරිපිට දක්නට ලැබෙනුයේ ඉතා මනස්කාන්ත වූ සෞභාග්‍යයේ සංකේතයක් බඳු වූ ජලයෙන් පිරීගිය ගල් පොකුණකි. ඔප මට්ටම් නොකරන ලද ගල් කුට්ටි භාවිත කරමින් කෘත්‍රිමව සකස් කර ඇති මෙම පොකුණ අක්කර භාගයක භූමි ප්‍රමාණයක නිර්මාණය කර තිබීම විශේෂ වේ. වර්තමානයේ දී මෙය අපවිත්‍ර වී ඇති අතර අතීතයේ විහාරස්ථානයේ පැන් පහසුව සඳහා මෙම පොකුණු භාවිත කරන්නට ඇත.

පිහිටි ගලේ සකසන ලද අලංකාර පියගැට පෙළකන්දේ ඉහළ ඉදි කිරීම් සඳහා ගමන් කිරීමට සකස් කර ඇති මනරම් නිර්මාණයකි. ගමන් මාර්ගයටම අයත් පියගැටපෙළේ දක්නට ලැබෙන සෙල්ලිපිය මෙහි ඇති තවත් වැදගත් අංගයක් වේ. ස්වභාවික ගලේ නිර්මාණය කරන ලද ගල් පඩි පෙළෙක මෙවැනි අලංකාර දිර්ඝ සෙල්ලිපියක් දක්නට ලැබෙන එකම ස්ථානය ලෙස රස්නකවැව විහාරය හඳුනාගත හැකිය. ඉහළ ඉදි කිරීම් සඳහා ළගා වීමට ඇත්තේ පිහිටි ගලෙහි සාදන ලද මෙම පියගැට පෙළෙන් වේ. පියගැට පෙළෙහි ඇති පියගැට අතර පර්වත මධ්‍යයෙහි ඇති පියගැට 10ක අපර බ්‍රාහ්මී අක්ෂරයෙන් කොටන ලද පේළි 29 කින් යුත් ශිලා ලේඛනයක් වේ. මෙම ශිලා ලේඛනයන්හි විහාරය සඳහා විවිධ දායකයන් විසින් පූජා කරන ලද පරිත්‍යාගයන් පිළිබඳ සඳහන් වේ. ගලින් කරන ලද පියගැටපෙළෙහි පිළිවෙළට කැටයම් කොටා ඇත. මේ සෙල්ලිපියෙහි අක්ෂර ගැඹුරට කොටා ඇති අතර අද ද ඉතා පැහැදිළි ලෙස මෙම අක්ෂර විද්‍යාමාන වේ. විවිධ පුද්ගලයන් විසින් කරන ලද පරිත්‍යාගයන් තනි තනිව සටහන් කර තනි සෙල්ලිපික් ලෙස මෙය පියගැට 10 ක සටහන් කර තිබේ. මෙහි A සහ C හි

පේළි දෙක පියගැට පෙළින් පිටතට විහිදි පර්වතයේ ද සටහන් කර තිබේ. මෙම සෙල්ලිපියේ සිංහල පරිවර්තනය පහතින් දැක්වේ.

A දඹල කුඹුරේ කල්සා කරවිටිකැටියේ ප්‍රදේශයක් වේ.

B කල්සා යනු ආදායම් සතුටුදායක කොටස, අස්වැනනේ පිඩරි

කොරනාඹකගේ පුතා උති මොජනාභින පදිංචිව සිටි පුරාණ මාපාගිරියට තමාගේ කොටස පරිත්‍යාග කර ඇත.

C අදූලාගේ පුතා, බුධි ආශ්‍රමයක් පරිත්‍යාග කර ඇත.

මොජනාභිනක පදිංචි මහාතිස්සගේ බාල සහෝදරයා සමාජයෙන් ඔහුට ලැබුණ කහපැන වලින් කොටසක් පරිත්‍යාග කර ඇත.

D සරිටා සමුදාගේ පුතා ගුට්ටා, මොරපාගිරිය අඹලවසාය සහ පදවසාය දායක කොට ඇත.

E කුඹුරේ කල්සා, වලියුබර ලෙස හඳුන්වා ඇත. කලා කුඹුර මාපාගිරියට අයත් කොටසක් වේ.

තලා කුඹුර සහ කාරිලා කුඹුර මේවායේ කල්සා දෙකක් ආශ්‍රමයට දායක කර ඇත. මේසවන්න අභය සහ ඔහුගේ මව

F-G අමාත්‍ය සිවියටකා මහාසියන්ගේ මව දහහතර කුඹුර කොටසක් භාරයන් ලෙස දායක කොට ඇත.

H-I අභධවරණය ගමේ පදිංචිව සිටි මුදාමාර ඔහුට ලැබෙන ආදායමෙන් කහපන හැටක් ආශ්‍රමයේ ස්වාමීන් වහන්සේලා හට පුජා කර ඇත. (ඇලේ මාළු ඇල්ලීමෙන් ලද ආදායමෙන්ය)

J ටබටා හි පදිංචි මහින්ද ආමාත්‍ය තුමාගේ සේවක අනුලා අලගඩක වැවේ, ඇලේ මාළු පරිත්‍යාග කොට ඇත.

සෙල්ලිපිය හරහා ජලය ගමන් කිරීම වැළැක්වීමට පර්වතය හරහා කපන ලද කාණුවක් වේ. එමගින් සෙල්ලිපිය ආරක්ෂා කරගෙන තිබේ. ඉහළ ඉදි කිරීම් සඳහා ගමන් කරන විට පර්වතයේ වම්පස කාණුවට ඉහළින් අලංකාරවත් ලෙස කැටයම් කරන ලද ගල් කුළුණක් පර්වතය මත පතිතව ඇති ආකාරය දැකගත හැකිය. එය අතීත ගල් වඩුවන්ගේ විශිෂ්ට නිර්මාණයක් ලෙස හඳුනාගත හැකිය.

මෙම ගල් පර්වතයේ පිහිටි ගලෙහි කරන ලද ගල් පඩි පෙළ අවසන් වන්නේ පර්වත මුදුනේ ඇති ස්තූපයෙන් ය. නමුත් වර්තමානය වන විට මෙහි පැරණි ස්තූපය දක්නට නොමැති අතර , එය වට කොට ඉදි කර ඇති නව ස්තූපය දැකගත හැකි වේ. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත්තේ 1980 දශකයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙනි. නව ස්තූපයේ පසෙකින් සිරිපතුල් ගලක් තැන්පත්කර ඇත. ස්තූපය ඉදිරිපසින් ඇති මාර්ගයෙහි මඳක් දුර ගමන් කරන විට ඉතා අලංකාර වූ ලෙන් විහාරයක් හමුවේ. කටාර කොටන ලද ලෙන මෙම ලෙන් විහාරය වර්තමානයේ දේවාලයක් ලෙස භාවිත කරයි. මෙම ලෙන් ගෘහය වර්තමානය වන විට විවිධ ප්‍රතිසංස්කරණයන්ට ලක් කර ඇත.

තවද මෙම විහාර පරිශ්‍රය තුළ අපට ළඟා වීමට නොහැකි ස්ථානයන් කිහිපයක කටාර කොටන ලද ලෙන් ලිපි සහිත ලෙන් කිහිපයක් ඇති බව විහාරස්ථ ස්වාමීන් වහන්සේ පැවසූ සේක. මේ

අයුරින් රස්නකවැව ගල් විහාර කන්ද විහාරයෙහි දක්නට ලැබෙන පුරාවිද්‍යාත්මක අවශේෂ පිළිබඳ සඳහන් කළ හැකි වේ.

මෙම රස්නකවැව ගල් විහාර කන්ද විහාරය පිහිටා තිබෙනුයේ සරුසාර තැනිතලා භූමියක් මධ්‍යයෙහි ඇති ශේෂ කඳු පර්වතයක් මූලික කරගෙනය. එල්ලංගාවක් මධ්‍යයෙහි ඇති මෙම රස්නක වැව අසලින් පදවිය වැවට ජලය සපයන ප්‍රධාන ජල මූලාශ්‍රය වන මොරඔය ගලා බසින අතර මේ ආශ්‍රිතව ඉතා සරුසාර වැව් පද්ධතියක් දක්නට ලැබේ. එම නිසාම මේ විහාරය අවට ඉතා විශාල සරුසාර කෙත් යායවල් අද ද දක්නට ලැබේ. මෙවන් මනරම් නිස්කලංක භූමි භාගයක පිහිටා ඇති මෙම විහාරයෙහි අතීත භික්ෂූන් භාවනායෝගීව වැඩ වාසය කරන්නට ඇති බවට විශ්වාස කළ හැකි වේ.

රස්නකවැව ගල් විහාර කන්ද විහාරයෙහි පුරාවිද්‍යාත්මක සාධක පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිළි වන්නේ මීට සමකාලීනව ඉතා දියුණු ලේඛන ක්‍රමයක් සේම තාක්ෂණයක් භාවිත කර තිබෙන බවය. ඉතා සියුම් උපකරණ නොමැතිව ගල් පාදම්, පිහිටි ගලේ පියගැට , කටාර හෝ සියුම් කවාකාර අක්ෂර සන කළුල්වල කෙටීම කළ නොහැකි බැවින් එකල වැසියන් ඉතා උසස් වානේ හෝ එ වැනි උපකරණ භාවිත කර ඇති බවට නිගමනය කළ හොත් තවත් වටිනා පුරාවිද්‍යාත්මක සාධක මතු කර ගැනීමට හැකියාව පවතී.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Paranavithana, S. (2001) Inscription of Ceylon. Vol II. Colombo: Department of Archaeology Ceylon.


**සම්මුඛ සාකච්ඡා**


වජිර හිමි, ගින්නලියේ. (2018.01.29). රස්නකවැව ගල් විහාර කන්ද විහාරය.

සමරනායක, ගාමිණී අබේසිරි. (2018.02.07) මිහින්තලේ ප්‍රාදේශීය පුරාවිද්‍යා කෞතුකාගාරය.




**ඡායාරූපය 01**
**පියගැටපෙළෙහි ඇති සෙල්ලිපිය**